හිතවත් බැංකු ගනුදෙනුකරුවනි,

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද පාරිභෝගික ප්‍රඥප්තිය යටතේ දැක්වෙන නියමයකට අනුව, අපගේ බැංකුව විසින් මූලික කරුණු අන්තර්ගත ලේඛන (Key Fact Documents) මාලාවක් සකස් කර ඇති අතර. ඔබට අවශ්‍ය වන සහ ඔබට සුදුසු වන පරිදි අපගේ බැංකුව විසින් සපයන බැංකු ගිණුම් පහසුකම්/සේවාවන් තෝරාගැනීම පිණිස ඔබට සහාය වීමට එකී ලේඛන මාලාවෙන් අපේක්ෂා කරනු ලැබේ.

පෞද්ගලික බැංකු කටයුතු සඳහා නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් හි තිබෙන ගිණුම් ආශ්‍රිත සුවිශේෂ පැකේජ සහිත විවිධ වර්ගයේ ශ්‍රී ලංකා රුපියල් ගිණුම් පිළිබඳව සහ පෞද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් පිළිබඳව පුළුල් සංක්ෂිප්ත විස්තරයක් මෙම මූලික කරුණු අන්තර්ගත ලේඛනයෙන් ඔබ වෙත සපයනු ලැබේ.

කෙසේ වුව ද, මෙම මූලික කරුණු අන්තර්ගත ලේඛනයේ සඳහන් කාරණාවන් නෛතික සහ නියාමන වෙනස්කම්වලට අනුව සහ අපගේ බැංකුවේ ප්‍රතිපත්තිවල සහ කාර්ය පටිපාටිවල සිදුවන වෙනස්ම්වලට අනුකූලව ප්‍රතිශෝධනය වීමක් අවශ්‍ය වියහැකි බව කරුණාවෙන් සලකන්න.

මේ පිළිබඳව වැඩිමනත් තොරතුරු ලබාගැනීමට ඔබ අපේක්ෂා කරන්නේ නම්, කරුණාකර www.nationstrust.com වෙබ් අඩවියට පිවිස හෝ 0114 711 411 දරන දුරකථන අංකයෙන් හෝ පැය 24 පුරා ක්‍රියාත්මක ඇමතුම් මධ්‍යස්ථානය ඔස්සේ අප බැංකුව ඇමතීමට කාරුණික වන්න.

පහත සඳහන් ඔබගේ යම් කවරම වූ ගිණුමක් සම්බන්ධයෙන් යම් කවරම වූ පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමට ඔබට ඇත්නම්, එම පැමිණිල්ල පිළිබඳ දැන්වීම අඩංගු ලුහුඩු ලිඛිත ප්‍රකාශයක් අප බැංකුවේ ;

**පැමිණිලි විසඳීමේ නිලධාරී, නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී, අංක 242, යූනියන් පෙදෙස, කොළඹ 02** යන ලිපිනයට භාරදීමෙන් හෝ දුරකථන අංක **[+94(0)11 4711411]** ඔස්සේ අප ඇමතීමෙන් හෝ customersesrvice@nationstrust.com යන විද්‍යුත් තැපැලට යොමු කිරීමෙන් දැනුම් දිය හැකි අතර, ඒ පිළිබඳව අප බැංකුව විසින් ඔබ වෙත ක්ෂණිකවම ප්‍රතිචාර දක්වන්නෙමු.

| **ගිණුම පිළිබඳ විස්තරය** | **බැංකු ගණුදෙනුකරුවන්ට අත්වන වාසි** | **ගාස්තු වර්ග සහ බැංකුව විසින් පනවන වෙනත් අයකිරීම්** | **ගිණුම විවෘත කිරීම පිණිස අනුගමනය කළයුතු කාර්ය පටිපාටි** | **ප්‍රධාන නියමයන් සහ කොන්දේසි** |
|---|---|---|---|---|
| **විශේෂ ගිණුම්** | | | | |
| නේෂන්ස් කිඩ්ස් ආයෝජන සැලැස්ම (Nations Kidz Investment Plan)<br>මෙම ගිණුම වනාහි අවම වශයෙන් වසර 2 ක සිට උපරිම වශයෙන් වසර 18ක් දක්වා විහිදී යන එකග වූ කාලසීමාවක් ("ඉලක්කගත කාලසීමාව") අවසානයේ ඉලක්කගත මුදලක් අත්කර ගැනීම පිණිස, ළමයෙකු වෙනුවෙන් සෑම මසකම ස්ථාවර ඉතිරි කිරීමේ මුදලක් ("ස්ථාවර මාසික වාරිකය") පසෙක තැබීම සඳහා බැංකු ගණුදෙනුකරුවෙකු වෙනුවෙන් හඳුන්වා දෙන ගිණුමකි. | ඉලක්කගත කාලසීමාව මුළුල්ලේම පොලී අනුපාතය සහතික කරනු ලැබේ.<br><br>මෙම ගිණුම විවෘත කිරීමෙන් ප්‍රතිලාභ අත්වන ළමයාගේ මාපියන් සඳහා හෝ නීත්‍යනුකූල භාරකරු සඳහා උපරිම වශයෙන් රුපියල් මිලියන 2ක් දක්වා නොමිලයේ රක්ෂණාවරණය හිමි වේ. | ගිණුම කල්පිරීමට පෙර වසා දැමීමේ දී, පහත සඳහන් දණ්ඩන අගයකට යටත් විය යුතු වේ.<br><br>ආයෝජන සැලැස්ම වසර 2 දී හෝ ඊට පෙර අවසන් කිරීම - නේෂන්ස් සේවර් හයස්ට් ටියර් (Nations Saver Highest Tier) සඳහා අදාළ වන අනුපාතය.<br><br>ආයෝජන සැලැස්ම වසර 2 ට පසුව අවසන් කිරීම - නේෂන්ස් සේවර් හයස්ට් ටියර් (Nations Saver Highest Tier) + 1% සඳහා අදාළ වන අනුපාතය | නේෂන්ස් කිඩ්ස් ආයෝජන සැලැසුම් ගිණුමක් (Nations Kidz Investment Plan Account) විවෘත කිරීම සඳහා වන ආකෘති පත්‍රය නිසි පරිදි සම්පූර්ණ කොට පහත සඳහන් ලියකියවිලි ද සමග භාරදිය යුතුය.<br><br>ළමයාගේ උප්පැන්න සහතිකයේ පිටපතක්.<br><br>මාපියාගේ / නීත්‍යනුකූල භාරකරුගේ ජාතික හැඳුනුම්පතේ / වලංගු ගමන් බලපත්‍රයේ පිටපතක්.<br><br>පදිංචි ලිපිනය ජාතික හැඳුනුම්පතේ හෝ ගමන් බලපත්‍රයේ ලිපිනයෙන් වෙනස් වන විටක දී, ලිපිනය තහවුරු කරගැනීම පිණිස ලේඛනමය සාක්ෂි අවශ්‍ය වේ. | ළමයා වෙනුවෙන් මාපියාට හෝ නීත්‍යනුකූල භාරකරුට ගිණුම විවෘත කිරීම කළ හැකිය.<br><br>ගිණුමේ අවම ශේෂයක අවශ්‍යතාවක් නොමැත. එනමුත් ස්ථාවර මාසික වාරිකය නොකඩවාම ප්‍රේෂණය කළ යුතු වන අතර, එවිට බැංකු ගණුදෙනුකරුට සම්පූර්ණ ඉලක්කගත මුදල අත්කර ගැනීමට හැකියාව ලැබේ.<br>ගිණුම්හිමියාගේ මරණය සිදුවුවහොත්, ගිණුමේ අරමුදල් අදාල බාලවයස්කරුගේ නමින් කිඩ්ස් ඉතිරි කිරීමේ ගිණුමට (Kidz Savings Account) මාරු කරනු ලැබේ.<br>බැංකුව විසින් ලබාදෙන, කලින් තීරණය කළ හැකි ආයෝජන සැලසුම් ගෙවීම් උපලේඛනයෙන් ඉලක්කගත මුදල තීරණය කිරීමට බැංකු ගණුදෙනුකරුට අභිමතයක් තිබෙන නමුත්, මාසික වාරිකය තීරණය කිරීමට එවැනි අභිමතයක් නොමැත.<br>ඉලක්කගත මුදල සඳහා අදාල වේ නම් රජයේ බදුවලට යටත් වේ.<br><br>බැංකු ගණුදෙනුකරු වෙත නේෂන්ස් කිඩ්ස් ආයෝජන සැලැස්ම (Nations Kidz Investment Plan) යටතේ සහ පෞද්ගලික ආයෝජන සැලැස්ම යටතේ (Personal Investment Plan Account) රක්ෂණාවරණයක් නිකුත් කර ඇත්නම්, බැංකු |

| | | | | |
|---|---|---|---|---|
| | | | | ණයදෙනුකරුගේ මරණය හේතුවෙන් ලැබෙන උපරිම රක්ෂණ මුදල රුපියල් 2,000,000/- ක් වේ. |